

# අපරාධ ජාලයන්ගෙන් රාජ්‍ය අංශය ආරක්ෂා කර ගැනීම

## තොරතුරු පත්‍රිකාව

**IBAC හි, අපගේ කාර්යභාරයේ කොටසක් වන්නේ වික්ටෝරියානු රාජ්‍ය අංශයෙන් අයුතු ප්‍රයෝජන ගන්නා අපරාධ ජාල විමර්ශනය කිරීම හා නැවැත්වීමයි.**

IBAC යනු වික්ටෝරියාවේ ස්වාධීන දූෂණ විරෝධී සහ පොලිස් අධීක්ෂණ ආයතනයයි. අපගේ ප්‍රාන්තය තුළ අවංකත්වය ශක්තිමත් කිරීමේ සමස්ත අරමුණ ඇතිව, රාජ්‍ය අංශයේ දූෂණ හා පොලිස් විෂමාචාර වැළැක්වීමට හා හෙළිදරව් කිරීමට අපි මෙහි සිටිමු.

අප කරන දෙයෙහි වැදගත් අංගයක් වන්නේ රාජ්‍ය අංශය තුළ සබඳතා වර්ධනය කර ගැනීමට උත්සාහ කරන සංවිධානාත්මක අපරාධ කණ්ඩායම්වල තර්ජනයට එරෙහිව ක්‍රියා කිරීම ය.  ඔවුන් මෙය සිදු කරන්නේ සීමිත තොරතුරු වෙත ප්‍රවේශ වීමට, වාර්තා වංචනික ලෙස වෙනස් කිරීමට, හෝ තීරණ වලට බලපෑම් කිරීමට ය. එමගින් ඔවුන්ට නීති විරෝධී ක්‍රියාකාරකම් සිදු කිරීමට හා හඳුනාගැනීමෙන් වැළකී සිටීමට උපකාරී විය හැකිය.

### අපරාධ ජාලයන් හඳුනා ගැනීම

අපරාධ ජාලයන් යනු බරපතල අපරාධ හා වැරදි සිදු කිරීම සඳහා එකට වැඩ කරන පුද්ගලයන් දෙදෙනෙකු හෝ වැඩි ගණනක කණ්ඩායම් වේ.

මෙම සංවිධානාත්මක අපරාධ කණ්ඩායම් රාජ්‍ය අංශයේ සේවකයින් ඉලක්ක කර ගනිමින් ඔවුන්ගේ නීතිවිරෝධී ක්‍රියාකාරකම් වලට අනුග්‍රහ දැක්වීමට හා නීතිය ක්‍රියාත්මක කිරීම මගින් අනාවරණය කර

ගැනීම වැළැක්වීමට උදව් විය හැකි සබඳතා ගොඩනගා ගැනීමට උත්සාහ කරති.

## ඔබ රාජ්‍ය අංශයේ සේවය කරන්නේ නම්, ඔබව ඉලක්ක කළ හැකිය

අපගේ විමර්ශන මගින් පෙනී යන්නේ සංවිධානාත්මක අපරාධ කණ්ඩායම් රාජ්‍ය අංශයේ සියලුම මට්ටම්වල සේවනියුක්තයන් ඉලක්ක කර ගන්නා බවයි.

ඔබ කවුන්සිලයේ සේවකයෙකු, දෙපාර්තමේන්තු නිලධාරියෙකු හෝ නීතිය ක්‍රියාත්මක ක්‍රියාත්මක කරන්නෙකු ලෙස සේවයේ යෙදී සිටියත්, අපරාධ ජාලයන්ගේ අවදානම පිළිබඳව ඔබ දැනුවත් විය යුතුය.

කිසියම් සැක කටයුතු ක්‍රියාවක් IBAC වෙත වාර්තා කිරීම මගින් රාජ්‍ය අංශය සංවිධානාත්මක අපරාධවලින් නිදහස් කර ගැනීමට අපට උපකාරී වනු ඇත.

## නිතර අසන ප්‍රශ්න

### ප්‍රශ්නය - රාජ්‍ය අංශයේ සංවිධාන අවදානමට ලක්වන්නේ කුමක් නිසාද?

පිළිතුර - ඔබේ සංවිධානයට සංවිධානාත්මක අපරාධ කණ්ඩායම්වලට අවශ්‍ය වටිනා තොරතුරු හෝ අයිතම වෙත ප්‍රවේශය තිබේ නම්, එවිට ඔබව ඉලක්ක කරගත හැකිය.

ඉලක්ක කර ගැනීමට බොහෝ ඉඩකඩ ඇති සංවිධාන වන්නේ:

- ආරක්ෂාව, ඉදිකිරීම්, සැලසුම්, සහ මත්පැන් හා සූදු කර්මාන්ත අධීක්ෂණය කරන සංවිධාන ඇතුළුව, තීරණ ගැනීමේ හැකියාව හා නියාමන බලතල ඇති සංවිධාන
- සංවේදී තොරතුරු හෝ නීතිය ක්‍රියාත්මක කිරීමේ විස්තර සඳහා ප්‍රවේශය ඇති සංවිධාන
- අනන්‍යතා සොරකම්වලට , සාක්ෂිකරුවන් බිය ගැන්වීමට හා බලෙන් පැහැර ගැනීමට තුඩු දිය හැකි, හෝ වෙනත් අපරාධ කණ්ඩායම්වලට අලෙවි කළ හැකි පුද්ගලික හඳුනාගැනීමේ තොරතුරු සහිත විශාල අනන්‍යතා දත්ත සමුදායන් වෙත ප්‍රවේශය ඇති සංවිධාන
- නැවත විකුණුම් සම්බන්ධ ඉහළ වටිනාකමක් සහිත දේපල හෝ භාණ්ඩ පාලනය කිරීමේ හැකියාව ඇති සංවිධාන

### ප්‍රශ්නය - ඔබට ඔබේ සංවිධානය අපරාධ ජාලයන්ගෙන් ආරක්ෂා කරගත හැක්කේ කෙසේද?

පිළිතුර

1. ආරක්ෂාවට ප්‍රමුඛත්වයක් දෙන්න. අවදානම් තක්සේරු කිරීම, නිතිපතා අහඹු විගණන සිදු කිරීම හා ඉහළ වටිනාකමකින් යුත් තොරතුරු සඳහා ආරක්ෂාව යෙදීම ක්‍රියාත්මක කරන්න.
2. අපරාධ කණ්ඩායම් සමඟ පවත්වන සම්බන්ධතා හඳුනා ගන්න.  සේවකයින්ට සම්බන්ධතා ප්‍රකාශ කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්න; බඳවා ගැනීම් හා රැකියා අතරතුර දී එය අනිවාර්ය කරන්න; එමන්ම අනුකූල නොවීමේ ප්‍රතිවිපාක නිර්වචනය කරන්න.
3. ප්‍රබල පූර්ව රැකියා පරීක්ෂාවන් ස්ථානගත කරන්න. ප්‍රවේශය හා සංවේදීතා මට්ටම් මත පදනම්ව සේවනියුක්තකයන් සූක්ෂමව පරීක්ෂා කරන්න; ආරක්ෂක අවසරයන් නිතිපතා අධීක්ෂණය කරන්න; එමෙන්ම වැඩි ප්‍රවේශයක් සහිත තනතුරු සඳහා සිදු කරන පරීක්ෂා කිරීම ශක්තිමත් කරන්න

   තෙවන පාර්ශව බඳවා ගැනීමේ නියෝජිතායතන භාවිතා කරන විට, ඔවුන් සුදුසු ප්‍රසම්පාදන ක්‍රියාවලීන් අනුගමනය කර කුසලතා මත පදනම් වූ තේරීම් ක්‍රියාවලීන් අනුගමනය කරන බව හා සදාචාරාත්මක භාවිතයන් යොදා හඳුනා බව සහතික කිරීම සඳහා නිසි අයුරින් කටයුතු කරන්න.

### ප්‍රශ්නය - සගයකුට අපරාධ සම්බන්ධතා ඇති බව පෙන්නුම් කළ හැක්කේ කවර සංඥා මගින් ද?

පිළිතුර - යමෙකුට අපරාධ සම්බන්ධතා ඇති බව දැක්වෙන සංඥා කිහිපයක් තිබේ. උදාහරණයක් ලෙස, එම පුද්ගලයා විසින් පහත දැක්වෙන දේ සිදු කළ හැකිය:

- පැහැදිලි කළ නොහැකි ධනයක් පෙන්නුම් කිරීම
- තම කාර්යභාරයේ කොටසක් නොවන

තොරතුරු ඉල්ලා සිටීම

- තම කාර්යභාරයේ කොටසක් නොවන පද්ධති වෙත ප්‍රවේශ වීමට ඉල්ලා සිටීම
- අතිකාල හෝ අසාමාන්‍ය වෙලාවලදී රාජකාරියේ යෙදීම
- නිවාඩු නොගැනීම.

## ප්‍රශ්නය - අපරාධ ජාලයන්ගෙන් ඔබව ආරක්ෂා කරගත හැක්කේ කෙසේද?

පිළිතුර

1. මූල්‍යමය වශයෙන් අපරාධයකට හසු වීම හෝ ණයගැති වීම ඇතුළුව අපරාධ ජාලයන් විසින් ඔබව පුද්ගලිකව අපකීර්තියට පත් කිරීමට තුඩු දිය හැකි අවදානම් ගැනීමේ හැසිරීම් වලින් වළකින්න.
2. අපරාධකරුවන් සමාජ මාධ්‍ය වේදිකා හරහා ඔබව ඉලක්ක කළ හැකි බැවින් මෙම නාලිකා භාවිතා කිරීමේදී ප්‍රවේශම් වන්න. ඔබේ සංවිධානය පිළිබඳ සංවේදී තොරතුරු සන්නිවේදනය කිරීමට සමාජ මාධ්‍ය භාවිතා නොකරන්න. නාඳුනන පුද්ගලයන්ගෙන් ලැබෙන සැකසහිත පණිවිඩ හෝ සබැඳි ක්ලික් නොකරන්න. එමෙන්ම ඔබ නොදන්නා පුද්ගලයින්ගෙන් ලැබෙන මිතුරු ඉල්ලීම් පිළිගැනීමේදී ප්‍රවේශම් වන්න.
3. ඔබේ ආයතනයේ සේවය නොකරන කිසිවකුට ඔබේ රැකියාව හා සම්බන්ධ ඔබේ කාර්යභාරය, ක්‍රියාවලියන්, පද්ධති හෝ තොරතුරු පිළිබඳ කිසිදු විස්තරයක් ලබා නොදෙන්න. මේ ආකාරයේ තොරතුරු වෙනත් අයෙකුට ලබා දීම සඳහා ගාස්තු පිරිනැමීම් ප්‍රතික්ෂේප කරන්න.
4. හවුල් අවශ්‍යතා හරහා ඔබව අපකීර්තිමත් තත්වයකට පත් කළ හැකි පෙර පැවති සබඳතා පිළිබඳව සලකා බලන්න. බැඳියාව පිළිබඳ ඕනෑම සත්‍ය, විභව හෝ ප්‍රත්‍යක්ෂ ගැටුම් ගැන ඔබගේ සේවායෝජකයාට ප්‍රකාශ කරන්න.

## රාජ්‍ය අංශය සංවිධානාත්මක අපරාධ වලින් ආරක්ෂා කර ගැනීමට උපකාරී වීම ඔබේ යුතුකමයි.

**ඔබ රාජ්‍ය අංශයේ රැකියාව කරන්නේ නම් සහ:**

- සංවිධානාත්මක අපරාධ කණ්ඩායමකට සම්බන්ධ කෙනෙකු ඔබ වෙත ළඟා වන්නේ නම්
- හෝ සංවිධානාත්මක අපරාධ කණ්ඩායමක් රාජ්‍ය අංශයට සම්බන්ධ බවට ඔබට තොරතුරු තිබේ නම්

**...ඔබට එය IBAC වෙත ආරක්ෂිතව වාර්තා කළ හැකිය.**

www.ibac.vic.gov.au හි වාර්තා කිරීම සඳහා ආරක්ෂිත මාර්ගගත පෝරමය පුරවන්න

ඔබට මාර්ගගත පෝරමයට ප්‍රවේශ වීමට අපහසු නම්, වැඩිදුර සහාය සඳහා **1300 735 135** ඔස්සේ අප අමතන්න.

Interpreter

ඔබට පරිවර්තන සහාය අවශ්‍ය නම්, **13 14 50** ඔස්සේ පරිවර්තන හා භාෂණ පරිවර්තන සේවාව අමතන්න, නැතහොත් **www.ibac.vic.gov.au/mylanguage** වෙත පිවිසෙන්න



2023 අගෝස්තු

අධ්‍යාපනය සහ වැළැක්වීම

ibac | Strengthening Victoria's Integrity